# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1858/8 - 2014 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

රෝහණ සංඝ සභාවේ වාර්ෂික උපසම්පදා උත්සවය

මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ 29 වැනි උපසම්පදා උත්සවය 2014 අප්‍රේල් මස 25, 26 හා 27 වැනි දිනවල තිහගොඩ ඌරපොල සිරි රතනජෝති පිරිවෙනස්ථ ශ්‍රී රෝහණ සංඝ සභා මූලස්ථානයේ දී හා මාතර කොටුවේගොඩ රන්දූපතේ පිහිටි ශ්‍රී රෝහණ උපෝසථාගාර රජමහා විහාරස්ථ උපසම්පදා මූලස්ථානයේ දී පැවැත්වෙන බවත්, එම උත්සවය සඳහා පැමිණෙන වන්දනාකරුවන් ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන රැගෙන ඒමෙන් වළකින ලෙසත්, 1991 ඔක්තෝබර් මස 14 වැනි දින ප්‍රකාශිත එල්ඩීබී 11/60 දරන 175 වැනි අධිකාරිය වන වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති නිත්‍ය නියෝග හා රෙගුලාසි උපසම්පදා උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගුව පවතින බවත් මෙයින් දැනුම් දෙමි.

රංජිත් යාපා,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
මාතර.

2014 අප්‍රේල් මස 11 වැනි දින,<br>
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 66


1A - G 19413— 65 (2014/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*